වැලිගම නගර සභාව

<u>මාතර දිස්ත්‍රික්කය.</u>

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 09 දිනද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 17 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට වැලිගම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂය අවසානයට රු.237,126 ක් වූ තොග ශේෂය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීම නිවැරදි නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ වියදම වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2020 මූල්‍ය ප්‍රකාශනවලදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු. 2,074,000 ක් වටිනා වාහන 02 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියළුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලදී ලේඛන සසඳා බලා නිවැරදිව පෙන්වීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.158,649 ක්වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියළුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතු වේ. | ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ මත වෙන්දේසි කර තිබූ රු.475,438 ක්වූ ස්ථාවර වත්කම්වල පිරිවැය ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ස්ථාවර වත්කම්වල පිරිවැය පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (v) | සමාලෝචිත වර්ෂය අවසානයට වටිනාකම රු.1,712,790 ක්වූ ජීවතොගය ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |
| (vi) | සමාලොචිත වර්ෂය අවසානයටවූ වීජී පහන් උපකරණ තොගය රු.112,800 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරියේ දී අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරමි. |
| (vii) | සමාලෝචිත වර්ෂයේ සභාව විසින් මිලදී ගෙන තිබූ රු.383,765 ක් වටිනා ආයුර්වේද ඖෂධ තොගය පරිත්‍යාග ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම් ආධාර අය ශීර්ෂය වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරියේ දී අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරමි. |
| (viii) | සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු රු.116,875 ක ආයෝජන ආදායම් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරියේ දී අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරමි. |
| (ix) | සමාලෝචිත වර්ෂයේ දේශීය ණය සංවර්ධන අරමුදලේ ණයවාරික ගෙවීම් රු.4,191,562 ක් ආදායම් වියදම් ගිණුමට හර කිරීම නිසා වර්ෂයේ අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරියේ දී අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරමි. |
| (x) | සමාලෝචිත වර්ෂයේදී ඉදිරි වර්ෂය සඳහා ලැබුණු රු.915,914 ක බදු කුලී කලින් ලද ආදායම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරියේ දී අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරමි. |
| (xi) | සභාව සතු රන් පොහොණිය අලෙවිසැලෙහි ශුද්ධ ආදායම ගණනයකර ආදායම් හා වියදම් ගිණුමට ගලපා නොතිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.401,200 ක්වූ ඉතිරි තොගය පුනරාගනවර්තන වියදමින් අඩුකර දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරියේ දී අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරමි. |
| (xii) | සමාලෝචි වර්ෂයේ අවසානයට කර්මාන්ත ණයගැති ශේෂය රු.1,906,309 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරියේ දී අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරමි. |
| (xiii) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු කර්මාන්ත ණයහිමි ශේෂය රු.255,986 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරියේ දී අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරමි. |
| (xiv) | සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | නිශ්චිත වශයෙන් ගෙවිය යුතු වියදමක් ලෙස |

| | |
|---|---|
| රු. 8,916,577 ක ශේෂය වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | හඳුනාගෙන නොමැති නිසා මෙම ගිණුම්වලින් ප්‍රතිපාදන සලසා නොමැත. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.173,578,226 ක් වූ ගිණුම් විෂයයන් 08 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන සහ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු.15,284,710 ක අසමානතා පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.133,454,690 ක් වූ ගිණුම් විෂයයන් 12 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට, ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට හා ශේෂ සනාථ සහතික ලබා ගෙන නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1646 | සභාව සතු වාහන හා යන්ත්‍ර උපකරණ 14 ක් සම්බන්ධයෙන් දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | දැනට වෙනත් නිලධාරියෙකු පත්කර ඇත. රියදුරන්ට ලිඛිතව දැනුවත් කළ පසු ධාවන සටහන් විෂය වෙත ලැබෙමින් පවතී. |

**2 මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.34,205,597 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.50,148,678 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 බිල්කළ ආදායම | 2019 රැස්කළ ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කළ ආදායම | 2018 රැස්කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 15,850,000 | 12,489,385 | 12,424,862 | 8,039,040 | 13,050,000 | 12,501,257 | 11,615,984 | 7,974,517 |
| කුලී | 17,625,000 | 21,338,827 | 19,078,720 | 11,298,908 | 15,203,000 | 15,149,632 | 11,537,415 | 9,038,801 |
| බලපත්‍ර ගාස්තු | 5,756,500 | 8,116,336 | 8,116,335 | 336,459 | 3,926,500 | 7,133,800 | 7,133,801 | 336,458 |
| වෙනත් ආදායම් | 47,761,000 | 29,973,026 | 17,643,712 | 59,750,675 | 49,364,000 | 47,057,390 | 27,055,034 | 47,421,361 |
| එකතුව | 86,992,500 | 71,917,574 | 57,263,629 | 79,425,082 | 81,543,500 | 81,842,079 | 57,342,234 | 64,771,137 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) වරිපනම්**<br>සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.7,655,788 ක් වූ අතර, රු.8,545,931 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සහ අධි ගාස්තු සමග රු.16,201,719 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුලදී මුළු අයවීම් රු.8,162,629 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.8,039,090 ක හිඟ ශේෂයක් පැවතුණි. මෙම හිඟහිටි වරිපනම් බදු ශේෂය තුළ වසර 03 ක කාලයක් ඉක්ම වූ එකතුව රු.4,907,260 ක ශේෂ ඇතුළත් වී තිබුණි. | හිඟ වරිපනම් ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | වරිපනම් අය කර ගැනීම සඳහා රතු නිවේදන බෙදා හැර ඇති අතර, දේපළ තහනමකට අදාල කටයුතු සිදු කරමින් පවතී. |
| **(ආ) විනෝද බදු**<br>ආරම්භක හිඟය රු.318,748 ක් වූ අතර, රු.109,225 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟරු.427,973 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු. 82,622 ක් වීම නිසා වර්ෂය අවසානයට රු. 345,351 ක් හිඟව පැවතුණි. | හිඟ විනෝද බදු ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | විනෝද බදු අය කර ගැනීම සඳහා දැනුවත් කිරීම් සිදු කර ඇත. |

### 2.2.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **කඩ කුලී**<br>ආරම්භක හිඟය රු.5,701,508 ක් වූ අතර, රු.8,388,953 ක් වූ වර්ෂයේ බිල්කිරීම් හා අධි ගාස්තු සමග රු.14,090,461 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුලදී මුළු අයවීම් රු.6,253,627ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.7,836,834 ක හිඟ ශේෂයක් පැවතුණි. මෙම හිඟහිටි කඩකුලී ශේෂය තුළ වසර 03 ක කාලයක් ඉක්ම වූ එකතුව රු.1,062,697 ක ශේෂ ඇතුළත් වී තිබුණි. | හිඟ කුලී කඩිනමින් අය කර ගත යුතු වේ. | කඩිනමින් නීතිමය කටයුතු සඳහා ඉදිරිපත් කර හිඟ මුදල් අය කිරීමට කටයුතු කරමි. |

(ආ) **බදු කුලී**

| | | |
|---|---|---|
| (i) ආරම්භක හිඟය රු.2,627,512 ක් වූ අතර, රු.6,439,138 ක් වූ වර්ෂයේ බිල්කිරීම් හා අධි ගාස්තු සමග රු.9,066,650 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුලදී මුළු අයවීම් රු. 5,594,577 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.3,472,073 ක හිඟ ශේෂයක් පැවතුණි. මෙම හිඟය තුළ සභාව සතු දේපල බදුදීමවලින් වර්ෂ 23කට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව තිබූ රු.862,886 ක හිඟ මුදලක් ඇතුළත්ව තිබූ අතර ඒ සඳහා සභාව විසින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී කඩිනමින් අය කර ගත යුතු වේ. | කඩිනමින් නීතිමය කටයුතු සඳහා ඉදිරිපත් කර හිඟ මුදල් අය කිරීමට කටයුතු කරමි. |

**2.2.4 බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආරම්භක හිඟ ශේෂය රු. 336,459 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් සමඟ අයවිය යුතු මුළු මුදල රු.8,116,336 ක් විය. වර්ෂයේ බිල් කිරීම් සියල්ල ලැබී තිබුණු නමුත්, හිඟ ශේෂයෙන් කිසිදු මුදලක් අයවී නොතිබුණි. | හිඟ බලපත්‍ර ගාස්තු කඩිනමින් අය කර ගත යුතු වේ. | හිඟ බලපත්‍ර ගාස්තු ලබා ගැනීම සඳහා නඩු පැවරීමට කටයුතු කර ඇත. |

**2.2.5 වෙනත් ආදායම්**

**උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ වෙනුවෙන් රු.136,101 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.59,614,574 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. | හිඟ ආදායම් ලබා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ ආකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වාර්තා වී තිබූ අනවසර ඉදිකිරීම් 17 කින් 13 ක් සම්බන්ධයෙන් නගර සභා ආඥා පනතේ 74 හා 84 වගන්ති ප්‍රකාරව කටයුතු කර විධිමත් කිරීමට වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අනවසර ඉදිකිරීම් හදුනාගෙන ඒවා ඉවත් කිරීමට හෝ නීත්‍යානුකූල කිරීමට කටයුතු කරමි. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | **සේවක පුරප්පාඩු හා අතිරික්ත**<br>අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 05 ක් සම්පූර්ණ කර ගැනීමට හා 37 ක්වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු වේ. | ප්‍රාථමික හා වෙනත් තනතුරු වල පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කර ඇති අතර, ජ්‍යෙෂ්ඨ හා ද්විතීයික තනතුරුවල පුරප්පාඩු සඳහා දැනුම් දී ඇත. |
| (ආ) | වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් 18 ක් සහ සෞඛ්‍ය කම්කරුවන් 62 දෙනෙකු අධීක්ෂණය සඳහා එක් සෞඛ්‍ය පරිපාලකවරයෙකු පමණක් යොදවාගෙන තිබූ අතර වැඩ / ක්ෂේත්‍ර පරිපාලක තනතුරෙහි පැවති පුරප්පාඩුව සම්පූර්ණ කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු වේ. | වැඩ/ක්ෂේත්‍ර පරිපාලක තනතුරෙහි පුරප්පාඩුව පිළිබඳ කාර්ය මණ්ඩල තොරතුරු යොමු කර දැනුම් දී ඇත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී සභාවේ වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් 10 දෙනෙකු සහ සෞඛ්‍ය කම්කරුවන් 04 දෙනෙකු වෙත සභා අරමුදලින් රු.5,279,080 ක වැටුප් හා දීමනා ගෙවා තිබූ අතර තනතුරට අදාල නියමිත රාජකාරි පැවරීමකින් තොරව සභාවේ විවිධ රාජකාරි පවරා තිබීම නිසා මහජන සුභසාධනය ,සෞඛ්‍ය කටයුතු හා මාර්ග නඩත්තු කටයුතු බාධා ඇතිවීමේ අවධානමක් පැවතුණි. තවද සෞඛ්‍ය කම්කරුවන් 09දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි. | බඳවා ගත් තනතුරු වලට අදාළව රාජකාරි පැවරීම කළ යුතු වේ. | සෞඛ්‍ය හා වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් 14 දෙනෙකු සේවා අවශ්‍යතාව මත වෙනත් රාජකාරීන් සඳහා අනුයුක්ත කර ඇති අතර, රාජකාරි ලැයිස්තුවක් ලබා දී ඇත. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දකුණු පළාත් ,පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපසඅ 6/5/පොදු හා 2010දෙසැම්බර් 27දිනැති චක්‍රලේඛයේ 05වන වගන්තිය ප්‍රකාරව කඩ කාමර හිමියන් සමඟ ඇතිකර ගන්නා ගිවිසුම් වර්ෂ 03කට වරක් යාවත්කාලීන කළයුතු වුවද කඩකාමර 77ක් වෙනුවෙන් එසේ කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | කඩ කාමර ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | ඉහත (අ) හි සඳහන් චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂ 05කට වරක් අදාල කඩකාමරයන්හි තක්සේරු මුදල සංශෝධනය කළයුතු වුවද එලෙස සංශෝධනය නොකරන ලද කඩකාමර 21 ක් පැවතුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | කඩකාමර සඳහා තක්සේරු කටයුතු සිදු කිරීමට කටයුතු කරමින් පවතී. |
| (ඇ) | ඉහත (අ) ඡේදයෙහි සඳහන් චක්‍රලේඛයේ 4 වන ඡේදය ප්‍රකාරව එක්වන් මුදල් අයකිරිමට කටයුතු නොකිරීම නිසා එක්වන් මුදල් රු.1,370,602 ක් 2007 වර්ෂයේ සිට හිඟව පැවතුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | එක්වන් මුදල් හිඟයෙන් රු.225,000 ක මුදලක් අය කර ගෙන ඇති අතර ඉතිරි හිඟ මුදල් අය කර ගැනීම සඳහා නීතිමය කටයුතු සිදු කරමින් පවතී. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු පර්චස් 06ක් වූ ඉඩම් 03ක් හා ප්‍රමාණය ලේඛනගත නොවූ ඉඩම් 02ක් අනවසරයෙන් පරිහරණය කිරීම සම්බන්ධයෙන් සභාව විසින් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අනවසර ඉදිකිරීම් පරීක්ෂා කර විධිමත් කිරීමට කටයුතු කළ යුතු වේ. | සභාව සතු ඉඩම් තුනක් මනිනු ලැබූ අතර, අනෙකුත් සියළුම ඉඩම් ද මැන කටු කම්බි ගසා නාම පුවරු සවි කිරීම සඳහා මේ වන විට කටයුතු කරමින් පවතී. |

### 3.4.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් රාජ්‍ය ආයතන සතු වාහන 04 ක් පරිහරණය කරමින් තිබූ අතර 2019 දෙසැම්බර් 31 වනවිටත් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පරිහරණය කරන සියළුම වාහන සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභාවට පවරා ගැනීමට ඉදිරියේ දී කටයුතු කරමි. |

### 3.4.3 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු අක්කර 01 රූඩ් 01 පර්චස් 12 ක් වූ ඉඩම් 03ක් සහ ප්‍රමාණය ලේඛනගත නොවූ ඉඩම් 02ක් ඵලදායී කාර්යයකට යෙදවීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | ඵලදායී කාර්යයන් සඳහා යොදාගත යුතු වේ. | ඉඩම් මැනීමෙන් අනතුරුව ඵලදායි කාර්යක් සඳහා යොදා ගැනීමට කටයුතු කරන අතර ප්‍රමාණය ලේඛනගත නොවූ ඉඩම් දෙක මැනීමෙන් අනතුරුව එම ප්‍රමාණයන් ලේඛනගත කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සභාව සතු ගොඩනැගිලි 10 ක් නිෂ්කාර්යව පැවතුණි . | ඵලදායී කාර්යයන් සඳහා යොදාගත යුතු වේ. | ඇතැම් ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඇස්තමේන්තු සකසා ඇති අතර, ගොඩනැගිලි දෙකක් ප්‍රතිසංස්කරණය සඳහා අවශ්‍ය භාණ්ඩ ද ගෙනැවිත් තිබේ. කොරෝනා වසංගතය හේතුවෙන් එම වැඩ කටයුතු ප්‍රමාද වී ඇත. |
| (ඇ) | භාණ්ඩාගාර ලේකම්ගේ 2018 මාර්තු 19 දිනැති වත්කම් හා කළමනාරණ චක්‍රලේඛ අංක 01/2018 ප්‍රකාරව ධාවන තත්ත්වයෙන් ඉවත්කර තිබූ වාහන 03 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අපහරණය කර නොතිබුණි. | ප්‍රයෝජනයට ගත නොහැකි වාහන නම් අපහරණ කටයුතු සිදු කළ යුතු වේ. | අපහරණය කිරීමට අවශ්‍ය අනුමැතිය ලබාගැනීම සඳහා 2020 මාර්තු 02 දින පළාත් පාලන ලේකම් වෙත යොමු කර ඇත. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**---------------------------------------**

**අභ්‍යන්තර විගණනය**

**-------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ----------------------- | ---------- | ---------------- |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතු වේ. | ඉදිරියේ දී අභ්‍යන්තර විගණනය පිළිබඳ කටයුතු නිසි ක්‍රමවේදයකට අනුව ක්‍රියාත්මක කරමි. |